## කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## තනතුරු පුරප්පාඩු - ආරක්ෂක නියාමක (කොන්ත්‍රාත් පදනම මත)

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින ආරක්ෂක නියාමක තනතුර සඳහා **ත්‍රිවිධ හමුදාවේ හෝ ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ** සේවය කර විශ්‍රාම ලැබූ පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති **ගම්පහ දිස්ත්‍රික්කයේ** ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් :**

1. අටවන ශ්‍රේණිය සමත්ව තිබීම.
2. ක්‍රීඩා හා සමාජීය කටයුතුවල ක්‍රියාශීලී ලෙස සහභාගිත්වය තිබිය යුතුය.
3. උස අඩි 05 අඟල් 04ට නොඅඩු විය යුතුය.
4. පපුව අඟල් 32ට නොඅඩු විය යුතුය.
5. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

- **වැටුප - රු. 50000.00 ( මාසික ස්ථාවර )**
- **කාලසීමාව - වසර 01**
- **ප්‍රතිලාභ - විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට හිමිකම් ලබයි**
- **තෝරා ගැනීම - සම්මුඛ පරීක්ෂණයක් මඟින්**

අයදුම් පත විශ්වවිද්‍යාල නිල වෙබ් අඩවියෙන් https://news.kln.ac.lk/index.php/classified/vacancies හෝ කැලණිය විශ්වවිද්‍යාලයේ ආරක්ෂක අංශය වෙත පැමිණ ලබා ගත හැක. එසේ ලබා ගන්නා ලද අයදුම්පත නිසිලෙස සම්පූර්ණ කර අදාළ සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතිකවල පිටපත්ද, සේවය කරන ලද ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ හෝ රාජ්‍ය ආරක්ෂක සේවාවෙන් විශ්‍රාම ගැන්වීමේ ලිපියෙහි හා ජාතික හැඳුනුම්පත්‍රයෙහි ඡායා පිටපත් සමඟ 2019.07.15 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **සහකාර ලේඛකාධිකාරි, ආයතන අනධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම් පත බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරෙහි ආරක්ෂක නියාමක (කොන්ත්‍රාත් පදනම මත) ලෙස සඳහන් කල යුතුය.

ප්‍රමාද වී ලැබෙන සහ අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේඛකාධිකාරි**
03.07.2019